**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 2022**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 7 ඡේදය ප්‍රකාරව කාලපරිච්ඡේදයට අදාළව මුළු ආදායම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු වුවද පාරිතෝෂික අරමුදල් ආයෝජනය කිරීමෙන් සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු රු.907,271 ක පොලී ආදායම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ලැබිය යුතු පොළී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ස්ථාවර තැන්පතු වෙනුවෙන් පොලී ලැබීම් ගිණුම්ගත කිරීම පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2:27:1:b හි සඳහන් පරිදි කල් පිරුණු දිනට ලැබෙන පොලී ගිණුම්ගත කර ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව වර්ෂයට අදාළ ආදායම හඳුනාගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 14 ඡේදය අනුව වත්කම් අයිතමය හා අනාගත ප්‍රතිලාභ හෝ | වෛද්‍යපීඨය ඉදිකර ඇති ඉඩමෙහි හිමිකාරීත්වය පිළිබඳව | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව |

| | | | |
|---|---|---|---|
| | සේවා අවශ්‍යතාවයක් ඇති විට හෝ එහි පිරිවැය සාධාරණ ලෙස මැනිය හැකි විට වත්කම් ලෙස හඳුනාගත යුතු වුවද, විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකර තිබුණු අක්කර 28 ක ඉඩමෙහි තක්සේරු වටිනාකම වූ රු.77,872,750 ක් 2017 වර්ෂයේ සිටම ඉඩම් යටතේ දැක්වීම වෙනුවට ඉන් රු.16,500,000ක් ප්‍රාග්ධන අත්තිකාරම් යටතේ ගිණුම්ගත කර තිබූ අතර රු.61,372,750ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ඉඩම් වටිනාකම රු.77,872,750ක් අඩුවෙන් දක්වා තිබුණි. එසේම 1999 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය භුක්ති විඳින අක්කර 22 ක ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | කුලියාපිටිය දිස්ත්‍රික් උසාවියේ නඩුවක් විනිශ්චය වෙමින් පවතින බැවින් රු.61,840,513 ක් මෙතෙක් ගෙවා නොමැති අතර ඒ පිළිබඳව 2016 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.26 හි හෙළිදරව් කර ඇති බව | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 50 ඡේදය ප්‍රකාරව එකිනෙකින් වෙනස් වූ වත්කම් පන්තීන් වෙන වෙනම දැක්වීමකින් තොරව විශ්වවිද්‍යාලයේ පිරිවැය රු.38,175,522 ක් වූ මාර්ග පද්ධති ඉඩම් යටතේ දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් වර්ගීකරණය පිළිබඳව නිකුත්කර ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 649 දරන චක්‍රලේඛය අනුව මාර්ග පිළිබඳව වත්කම් පන්තියක් නම්කර නොමැති හෙයින් 2020 වර්ෂයේ පැවති 71 වන විගණන කමිටු රැස්වීමේදී ඉඩම් හා මාර්ග එකම වත්කම් පන්තියක දැක්වීමටත් ඉඩම් හා මාර්ග ක්‍රමක්ෂය නොකිරීමටත් මෙය ගිණුම්කරණ ප්‍රතිපත්තියක් ලෙස අවසන් ගිණුම්වල පෙන්නුම් කළ යුතු බවත් තීරණය කල බැවින් මාර්ග වල වටිනාකම් ඉඩම් යටතේ දක්වා ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව වත්කම් හඳුනාගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 19 (ආ) ඡේදය ප්‍රකාරව භාණ්ඩ හෝ සේවාවක් ලබා ගෙන ඇති නමුත් සැපයුම්කරුට ගෙවීම් | මෙම නඩුව 2022 නොවැම්බර් 25 දින අවසන් වුව ද, නීතිපති දෙපාර්තමේන්තුව විසින් | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ |

| | | | |
|---|---|---|---|
| | කර නොමැති, ඉන්වොයිස් කර නොමැති හෝ සැපයුම්කරු සමඟ විධිමත් එකඟතාවයක් නොමැති වූ වියදම් ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද ගිවිසුම් කඩකළ ආචාර්යවරයෙකුගේ බැඳුම්කර වටිනාකම අයකර ගැනීම සඳහා 2004 වර්ෂයේ ගොනුකර තිබූ නඩුවක් 2022 නොවැම්බර් 25 වන දින අවසන් වී තිබුණද එම නඩුවට අදාලව නීතිපති දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුදල් අගය කොට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම නඩුවට අදාල බිල්පත තවමත් විශ්වවිද්‍යාලය වෙත එවා නොමැති බැවින්, එය ගෙවිය යුතු වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය නොහැකි බව. | යුතුය. |
| (ඉ) | ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්පත් කර ගැනීමට කටයුතු කරමින් සිටින වෛද්‍ය පීඨය පිහිටි ඉඩමේ භුක්තිය භාරගත් දින සිට සියයට 7 ක වාර්ෂික පොලියක් 2017 වර්ෂයේ ඉඩම් තක්සේරු වටිනාකම වූ රු.77,872,750 ට අමතරව 2022 දෙසැම්බර් 31 දින දක්වා ආසන්න වශයෙන් රු.35,432,101 ක් ඉඩම් හිමිකරුට ගෙවිය යුතු වුවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකර නොතිබුණි. | මෙම ඉඩමෙහි හිමිකාරීත්වය පිළිබඳව කුලියාපිටිය දිස්ත්‍රික් අධිකරණයේ පවතින නඩුව අවසන් වී නොමැති බැවින් මේ සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සිදුකර නොමැති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8හි 100 ඡේදයේ දැක්වෙන පරිදි අසම්භාව්‍ය වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද විශ්වවිද්‍යාලයේ සේවය කර අනිවාර්ය නිවාඩු යවා ඇති ආචාර්යවරයෙකු විසින් රු.මිලියන 150ක වන්දි මුදලක් ඉල්ලා විශ්වවිද්‍යාලය ඇතුළු පාර්ශව 25ක් විත්තිකරුවන් කරමින් 2019 වර්ෂයේ ගොනුකර දැනට විභාග වෙමින් පවතින නඩුව පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | රු. මිලියන 150 ක මුදල වන්දි ලෙස ඉල්ලා ඇත්තේ නඩුවේ සියලු පාර්ශව වෙතින් බව. ඒ අනුව නඩු තීන්දුව දීමට ප්‍රථම මෙම මිලියන 150ක මුදල විශ්වවිද්‍යාලයෙන් අයවිය යුතු මුදලක් ලෙස හෙළිදරව් කළහොත්, මෙම නඩුවේ මුළු වටිනාකම විශ්වවිද්‍යාලය විසින් ව්‍යංග ලෙස ගෙවීමට බැඳී ඇති බව.<br>සියලු නඩු කටයුතු අවසන් වන තෙක් මෙම නඩුව සඳහා නිශ්චිතව ගෙවිය යුතු මුදලක් හඳුනාගත නොහැකි බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව අසම්භාව්‍ය වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂය තුලදී ලැබී තිබූ එකතුව රු.736,471,987 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන, පරිත්‍යාග හා අනෙකුත් ප්‍රාග්ධන ස්වරූපයේ ලැබීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට අදාල ප්‍රමිතිය පරිදි ප්‍රාග්ධන ප්‍රදාන, පරිත්‍යාග හා අනෙකුත් ප්‍රදාන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| උද්‍යානවිද්‍යා හා භූමිඅලංකරණ අධ්‍යයන අංශයේ රසායනාගාරය සඳහා 2022 නොවැම්බර් මිලදීගෙන තිබුණු රු.19,515,924ක් වටිනා ලීබඩු සහ සවිකිරීම්, ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | කොන්ත්‍රාත්තුව සම්බන්ධ අවසන් බිල්පත ගෙවීම සඳහා බිල්පත් තොරතුරු අප වෙත ලැබුණු පසුව එය පදනම් කරගෙන 2023 J/V මගින් ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර ඇති බව | ජංගම නොවන වත්කම් නිවැරදි වර්ගීකරණයකට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ ඡේද3.1 | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර නොගෙන සමාලෝචිත වර්ෂය තුල දී වැටුප් හා දීමනා ලෙස රු.1,039,705,068ක් ගෙවා තිබුණි. | සාමාන්‍ය පිළිවෙතක් ලෙස විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිටින අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් ඇඟිලි සලකුණු මගින් හෝ වෙනත් ආකාරයකින් පැමිණීම හා පිටවීම සටහන් නොකළ ද, සියලු අධ්‍යයන හා පරිපාලනමය රාජකාරී කටයුතු ඔවුන් විසින් නොපිරිහෙලා ඉටු කරනු ලබන බව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | | | |
| (i) | 2 සහ 4.5 ඡේද | ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් ශුන්‍ය පදනම යටතේ පවත්වාගෙන යා යුතු බවට දක්වා තිබුණ ද , ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 18කට අදාලව ලැබී තිබුණු ආදායමෙන් රු.126,452,295ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | පාඨමාලා සංවර්ධන අරමුදලේ පැවති ශේෂයන් ආයෝජනය කරන ලද බව. | අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 5.1.6ඡේදය | ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම්වල මුළු ආදායමින් සියයට 0.01ක ප්‍රතිශතයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. | මෙම දායකත්වය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කිරීම පිළිබඳ තීරණයක් ගෙන නොමැති බව. | අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | ඡේදය 5.2.3 | ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා චක්‍රව සම්බන්ධ වන නිළධාරීන්ට මුළු චක්‍ර පිරිවැයෙන් සියයට 10ක උපරිම ප්‍රමාණයක් දක්වා පමණක් ගෙවීම් කළ යුතු බවට දක්වා ඇතත්, විශ්වවිද්‍යාලයේ 2018 ජනවාරි 01 දින සිට 2022 ජූලි 31 දින දක්වා ක්‍රියාත්මක කර තිබුණු ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 93කින් උපරිම සීමාව ඉක්මවා රු.35,459,271ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | පාලක සභාව විසින් අනුමත කළ අයවැය ලේඛන අනුව ගෙවීම් කර ඇති බව. | අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | ඡේදය 5.3 | සංවර්ධන වැය විෂයයන් සඳහා වෙන්කරන ලද දායක මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු බවට දක්වා ඇතත් ,2018 ජනවාරි 01 දින සිට 2022 ජූලි 31 දක්වා විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් | පාලක සභාව විසින් අනුමත කළ අයවැය ලේඛන අනුව මෙම මුදල් ගිණුම්ගත කර ඇති බව. | අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වලින් 5.2.1 හා 5.2.2 යටතේ සංවර්ධන වැය විෂයයන්ට රු.6,276,882ක් ඇස්තමේන්තු කර තිබුණද 2022 ජූලි 31 දින වන විටත් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි. එසේම ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් වලින් 5.1.4 යටතේ සංවර්ධන වැය විෂයයන් සඳහා ඇස්තමේන්තු කිරීමද සිදුකර නොතිබුණි. | | |
| (ඇ) | 2022 ජූනි 10 දිනැති අංක 03/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය. | විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යෙදවීම, අදාල චක්‍රලේඛයෙන් අත්හිටුවා තිබියදී ඊට අනුකූල නොවන පරිදි කොන්ත්‍රාත් පදනම මත 2022 මැයි සිට නිලධාරියෙකු බඳවාගෙන 2023 ජනවාරි දක්වා එකතුව රු.800,000ක දීමනා ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාලයක ප්‍රධාන විධායක පරිපාලන නිලධාරියා වන උපකුලපතිවරයාගේ කාර්යාල කටයුතු වඩාත් හොඳින් විශිෂ්ට ලෙස පවත්වාගෙන යා යුතු බැවින් උපකුලපතිවරයාගේ පෞද්ගලික ලේකම්වරිය විශ්‍රාම ගත් පසුව සේවා දිගුවක් ලබා දීමට යාමට සිදු වූ බව. කෙසේවුවත්, 2023.02.09 දින සිට එම නිලධාරිනියගේ සේවය අත්හිටුවා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 3/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | රාජ්‍ය වියදම් පාලනය කිරීම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි දේශීය අරමුදල් මගින් සිදුකරනු ලබන විදේශ අධ්‍යාපන චාරිකා හා පුහුණු නැවැත්විය යුතු බවට උපදෙස් ලබාදී තිබියදී විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයේ 05 දෙනෙකු සඳහා 2022 මැයි සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුල ගුවන් ටිකට්පත් මිලදී ගැනීම වෙනුවෙන් රු.2,631,800ක් වැය කර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් UGC/DA-F/Bond Violation යටතේ 09.11.2022 දාතමින් නිකුත් කර ඇති ලිපිය මඟින් බැඳුම්කර උල්ලංඝණය කරන කාර්මණ්ඩලය විසින් ගෙවනු ලබන මුදලින් අධ්‍යයන නිවාඩු ලබා ගන්නා අධ්‍යයන කාර්යමණ්ඩලයට සහ සප්ත වාර්ෂික නිවාඩු ලබා ගන්නා කාර්යමණ්ඩලයට | විදේශ අධ්‍යයන, චාරිකා හා පුහුණු වැඩසටහන් සඳහා දේශීය අරමුදල් භාවිතා කිරීම වලක්වමින් නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු |

| | | | |
|---|---|---|---|
| | | ගුවන් ටිකට්පත් මිළ දී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇති බව. තවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ HE/UD/01/Letters-01 හා 20.04.2023 දිනැති ලිපිය ප්‍රකාරව බැඳුම්කර උල්ලංඝණ අරමුදලින් සප්ත වාර්ෂික නිවාඩු සහ අධ්‍යයන නිවාඩුලාභීන්ට රු.750,000 ක උපරිමයකට යටත්ව ගුවන් ටිකට්පත් ලබා දීමට කැබිනට් අනුමැතිය හිමි වී ඇති බව. | කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.198,176,461 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.53,983,044 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.144,193,417 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වැටුප් හා දීමනා, ක්ෂය හා ගිවිසුම්ගත සේවා හා සැපයුම් වියදම් වල වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාකඳුර ප්‍රදේශයේ පර්චස් 711 ක් පමණ වූ කුඹුරු ඉඩම් 08 ක් විශ්වවිද්‍යාලයට පවරා ගැනීමේ කටයුතු 2013 වර්ෂයේ ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 10ක් පමණ ගතවී තිබුණ ද එම කුඹුරු ඉඩම් පවරා ගැනීමේ කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි. | මෙම ඉඩම පවරා ගැනීමට අදාළ කටයුතු සිදු වෙමින් පවතින බව. | අදාල ඉඩම් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සෞදි රජයේ ණය මුදලක් මත අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන නගර සංවර්ධන ව්‍යාපෘති කාර්යාලය 2021 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය තුල පවත්වාගෙන යාම සඳහා ඉඩපහසුකම් ලබා දී තිබුණ ද ඒ වෙනුවෙන් විශ්වවිද්‍යාලය හා නගර සංවර්ධන ව්‍යාපෘතිය අතර එකඟතා ගිවිසුමක් ඇතිකරගෙන නොතිබුණු අතර කාර්යාලීය ඉඩ පහසුකම් ලබාදීම වෙනුවෙන් ව්‍යාපෘතියෙන් කුලී මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති කාර්යාලය සෘජු අධීක්ෂණයක් යටතේ පවත්වාගෙන යාමේ අරමුණින් විශ්වවිද්‍යාලයේ ගොඩනැඟිල්ලක පවත්වා ගෙන යනු ලබන අතර මෙම ගොඩනැඟිල්ල රජයේ අරමුදල්වලින් ඉදිකල වූවක් බැවින් කුලියක් ලබා නොගැනීමට තීරණය කර ඇත. තවද මෙම සෞදි සංවර්ධන පදනම යටතේ ලැබෙන අරමුදල් විශ්වවිද්‍යාලයේ සංවර්ධන කටයුතු සඳහා පමණක් ලබා දෙන බැවින්, මහභාණ්ඩාගාරයේ මුදල් විශ්වවිද්‍යාලයීය දේපලක් සඳහා කුලී මුදලක් ගෙවීම වෙනුවෙන් භාවිතා නොකළ අතර 2023.03.28 දින රැස්වූ මෙම ව්‍යාපෘතියට අදාළ පාලන කමිටුව විසින් ද එසේ ගෙවීමක් සිදු නොකළ යුතු බවට තීරණය කර ඇති බව | විශ්වවිද්‍යාලයට අයත් සම්පත් පරිහරණය කිරිම වෙනුවෙන් අදාළ පාර්ශවයන් සමඟ ගිවිසුමකට එළඹ, කුලී හා ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.17,828,424 ක් වූ ජෙනරේටර් 03 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කාර්යයේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (ආ), 2.12 (අ) හා 4.2.2 (ආ) ඡේදයන්හි අවශ්‍යතාවයන් ඉටුවී නොමැති අතර, ලංසු බාරගන්නා දිනය වෙනස් කරමින් අවස්ථා 02 දී පුවත්පත් 03 බැඟින් වන වෙළඳ දැන්වීම් 06 ක් පල කර තිබුණි. ඒ අනුව, ප්‍රසම්පාදන කාර්යය නිසි පරිදි සැලසුම් නොකිරීම හේතුවෙන් පුවත්පත් දැන්වීම් පළකිරීම සඳහා | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. ඉදිරියේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද ප්‍රකාරව කටයුතු කරනු ඇත. පලමු පුවත්පත් දැන්වීමෙහි ටෙන්ඩර් නිකුත් කිරීමේ හා විවෘත කිරීමේ වේලාවල් පරස්පර වීම නිසා දෙවනවර දැන්වීමක් පල කිරීමට සිදුවූ අතර කොවිඩ් 19 හේතුවෙන් රට වසා තැබීම නිසා ටෙන්ඩර් විවෘත කරන දිනය සංශෝධනය කර තෙවන පුවත්පත් දැන්වීම පල කිරීමට සිදු වූ බව. | ප්‍රසම්පාදන කටයුතු නිසිලෙස සැලසුම්කර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

රු.130,086 ක අමතර වියදමක් දැරීමට සිදුවී තිබුණි.

4. **අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාග්ධන වැය විෂයයන් 10 ක් යටතේ ලැබී තිබුණු ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.40,268,238 ක් වියදම් දරා තිබුණි. | මාකඳුර නේවාසිකාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර v හා vi වෙනුවෙන් 2022 වර්ෂය තුල ප්‍රයෝජනයට නොගන්නා අරමුදල් උපයෝගී කරගෙන ගෙවීම් සිදුකර ඇති අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 2023 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන තුළින් වෙන්කර ඇති බව. | අරමුදල් පිහිටුවීමේ අරමුණින් බැහැරව වියදම් කිරීමට විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. |